සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 - (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 - (2025)
Year End Evaluation - 2024 - (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

# I කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ආසියාවේ සාපේක්ෂ පිහිටීම අනුව නැගෙනහිර පිහිටි සාගරය කුමක් ද?
   (1) ඉන්දියන් (2) අත්ලන්තික් (3) පැසිපික් (4) ආක්ටික්
2. ලෝකයේ වඩාත් උසින් ම පිහිටි සානුව වන්නේ,
   (1) ඩෙකෑන් සානුවයි (2) පාමීර් සානුවයි (3) ඉරාන සානුවයි (4) ටිබෙට් සානුවයි
3. ශ්‍රී ලංකාවේ පිහිටි ශේෂ කන්දකි,
   (1) නකල්ස් (2) රිටිගල (3) නමුනුකුල (4) සමනල
4. ශ්‍රී ලංකාවේ අඩුම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය වනුයේ,
   (1) මුලතිව් (2) වව්නියාව (3) මොනරාගල (4) මන්නාරම
5. 1: 50000 හු ලක්ෂණ සිතියමක සංස්කෘතික භූ ලක්ෂණයකි,
   (1) ගංගාව (2) දිය ඇලි (3) වාරි ඇල (4) දියවල

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් "√" ලකුණ ද, වැරදි නම් "X" ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

6. බයිකල් විල ලෝකයේ ගැඹුරුතම මිරිදිය විල ලෙස සැලකේ. ( )
7. ලෝකයේ විශාලතම ආර්ථිකය හිමි රට වන්නේ ජපානය යි. ( )
8. නිරිත දිග මෝසම් සුළඟ අනුරාධපුර ප්‍රදේශයේ දී 'කච්චාන්' නමින් හැඳින් වේ ( )
9. ශ්‍රී ලංකාවේ 2010 වර්ෂයේ ළදරු මරණ අනුපාතිකය වැඩිම දිස්ත්‍රික්කය මඩකලපුවයි. ( )
10. පරිපාලන මායිම් නිර්මාණය කිරීමේ දී ගංගා, කඳුවැටිය යන භෞතික ලක්ෂණ ද පදනම් කරගෙන ඇත ( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා, දී ඇති හිස්තැන මත ලියන්න.
  (එරල්, කැස්පියන්, පට්ටිපොළ, කොග්ගල, අරාබි, මහනුවර)

11. ඉන්දු ගංගාව කරච්චි නගරය අසලින් .................................................... මුහුදට වැටේ.
12. සර්ඩේරියා ගංගාව .................................................... මුහුදට ගලා බසී.

13. යුරල් ගංගාව .............................................. මුහුදට ගලා බසී.

14. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය ............................................. ප්‍රදේශයේ සිදු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාපයක් .............................................. පිහිටා ඇත.

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් 'අ' තීරුවේ දැක්වෙන ප්‍රදේශය 'ආ' තීරුවේ දැක්වෙන පිළිතුර සමග නිවැරදිව ගලපන්න.

| අ<br>ව්‍යාප්ත වූ ප්‍රදේශ | ආ<br>වෘක්ෂලතා කලාප |
|---|---|
| 16. කඳපොළ | කඩොලාන |
| 17. තංගල්ල | පහතරට තෙත් කලාපීය වනාන්තර |
| 18. මාදුරු ඔය | කඳුකර වියළි කලාපීය වනාන්තර |
| 19. බඹරබොටුව | පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර |
| 20. බූන්දල | අතරමැදි සදාහරිත වනාන්තර |

(ල. 2x20=40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

(1.) (අ) ඔබට සපයා ඇති ආසියානු ප්‍රදේශය දැක්වෙන සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




i.) A. අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?
(නේපාලය/ පාකිස්තානය)

ii.) B. අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?
(හොවැංහෝ/ සිකියැං)

iii.) C. අක්ෂරයෙන් දැක්වෙන විල කුමක් ද?
(බෝල්කෑෂ්/ බයිකල්)

iv.) D. අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය කුමක් ද?
(හිමාලයා/සුලෙයිමාන්) (ල. 4×2=8)

(ආ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i.) E. අක්ෂරයෙන් දැක්වෙන කලාපය කුමක් ද?
(වියළි කලාපය/ තෙත් කලාපය)

ii.) F. අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?
(දැදුරු ඔය/ වලවේ ගඟ)

iii.) G. අක්ෂරයෙන් දැක්වෙන වරාය කුමක් ද?
(ත්‍රිකුණාමලය වරාය/ හම්බන්තොට වරාය)

iv.) H. අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?
(ඩෙල්ෆ්ට්/ මන්නාරම) (ල. 4×2=8)

(2.) (i.) ඉන්දියන් සාගරය තුළ පිහිටි කුඩා දූපත් දෙකක් ලියන්න. (ල. 02)

(ii.) ආසියානු ප්‍රදේශයේ දක්නට ලැබෙන භෞතික හා මානුෂ වශයෙන් සුවිශේෂ වූ ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)

(iii.) (අ) ආසියානු ප්‍රදේශයේ ප්‍රධාන දේශගුණ කලාප දෙකක් ලියන්න. (ල. 02)

(ආ) එම දේශගුණ කලාප දෙක පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

3. (i.) ආසියානු ප්‍රදේශයේ අඩුම උෂ්ණත්වය හා වැඩිම උෂ්ණත්වයක් පෙන්වන නගර දෙක නම් කරන්න. (ල. 02)
(ii.) මොන්ගෝලොයිඩ් හා කොකසොයිඩ් යන මානව වර්ග දෙක ජීවත් වන රටවල් දෙක බැගින් ලියන්න. (ල. 04)
(iii.)(අ) ආසියාවේ ආර්ථික ක්‍රියාකාරකම් තුළ, පහත අංශ දෙක සඳහා ප්‍රධාන රටවල් එක බැගින් ලියන්න.
a) කෘෂිකාර්මික -
b) සේවා - (ල. 02)
(ආ) ආසියානු ප්‍රදේශයේ කාර්මික අංශයේ ප්‍රධාන තැනක් උසුලන රටක් පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

4. (i.) ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාව ආශ්‍රිත ගංගාවල වෘද්ධ අවස්ථාවේ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)
(ii.) ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරය ආශ්‍රිත ප්‍රධාන සානු දෙකක් හා කපොලු දෙකක් නම් කරන්න. (ල. 04)
(iii.)(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජලවහන රටා දෙකක් නම් කරන්න. (ල. 02)
(ආ) ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

5. (i.) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප තීරණය කිරීමට බල පෑ සාධක දෙකක් නම් කරන්න. (ල. 02)
(ii.) පහත රට තෙත් කලාපීය වනාන්තරවල වෘක්ෂලතා ලක්ෂණ හතරක් ලියන්න. (ල. 04)
(iii.)(අ) ශ්‍රී ලංකාවේ කටු පඳුරු හා ලඳු කැලෑ ආශ්‍රිත ප්‍රධාන ශාක වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)
(ආ) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපාන සාධකයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

6. (i.) ශ්‍රී ලංකාවේ වියළි කලාපය ආශ්‍රිතව දක්නට ලැබෙන කෘෂිකාර්මික කටයුතු දෙකක් ලියන්න. (ල. 02)
(ii.) සංවර්ධනය දැක්වීමට යොදා ගන්නා දර්ශක දෙකක් සඳහන් කරන්න. (ල. 04)
(iii.)(අ) පාරිසරික අසංතුලනයට බලපාන හේතු දෙකක් ලියන්න. (ල. 02)
(ආ) තිරසර සංවර්ධනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

7. (i.) ශ්‍රී ලංකාවේ පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව හා කොළඹ සිට සංගමන්කන්ද තුඩුව දක්වා දුර කිලෝමීටර වලින් වෙන වෙන ම දක්වන්න. (ල. 02)
(ii.) පහත සඳහන් ලක්ෂණ සඳහා සම්මත සංකේත හා වර්ණ යොදා ඇඳ දක්වන්න.
a) පළාත් මායිම
b) සංචාරක බංගලාව
c) සෙසු මාර්ග
d) තේ වගාව (ල. 04)
(iii.) භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධතාව කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)